## Google Play Store වෙත ඍජු ගෙවීම් කළ හැකි ක්‍රමවේදයක් හඳුන්වා දුන් පළමු ශ්‍රී ලාංකික දුරකථන ජාලය බවට එයාර්ටෙල් එයාර්ප්ලේ පත්වෙයි

මෑතකදී ඊ ක්‍රීඩා ජාතික ක්‍රීඩාවක් කළ පළමු දකුණු ආසියාතික රට බවට ශ්‍රී ලංකාව පත් වූ අතර මිලියන 32 ක ජංගම දුරකථන ග්‍රාහකයින් පිරිසක් සමග ඩිජිටල් සමාජයක් කරා අප වේගයෙන් ගමන් කරමින් සිටියි.

යෙදුම් එසේත් නැතිනම් අප කවුරුත් දන්නා ඇප්ස් වර්තමානයේ විශාල ව්‍යාපාරයක් වන අතර වීඩියෝ ක්‍රීඩා ගෘහස්ථ ව්‍යාපාර ,විනෝදාස්වාදය ලබා දෙන අංශයන් ඉහළ නැංවීමට එය විශාල දායකත්වයක් ලබා දී තිබේ.කෙසේ වෙතත්, සීමිත සාම්ප්‍රදායික ගෙවීම් ක්‍රමවේදයන් වන කැෂ් ඔන් ඩිලිවරි සහ පෙර ඇණවුම් බැංකු තැන්පතු යනාදිය ඩිජිටල් අත්දැකීම් ලබා ගැනීම සඳහා බාධාවන් ඇති කර තිබේ.මෙවන් පසුබිමක් තුළ ඇප්ස් සමග ගනුදෙනු කිරීමට අප සූදානම් ද යන ප්‍රශ්ණය ඇසිය යුතු වෙයි.

නමුත් එයාර්ටෙල් "එයාර්පේ" ඍජු බිල්පත් ගෙවීම් සේවය Direct Carrier Billing (DCB) හඳුන්වා දීමත් සමග ශ්‍රී ලාංකීය තරුණ ප්‍රජාව ඒ වෙත යොමු වෙමින් සිටින අතර අන්තර්ජාලය හරහා ගනුදෙනු ආරම්භ කිරීමට උනන්දුවක් දක්වන බවත් පෙනී යයි.මන්ද ඔවුන්ට අවශ්‍යව තිබුණේ විශ්වසනීයත්වය සහතික කළ හැකි පහසු ප්‍රවේශයක් පමණක් වන අතර එයාර්ටෙල් "එයාර්පේ" මගින් එම අවශ්‍යතාව ඉටු වී තිබේ.මෙහි ජනප්‍රියතාව කෙතෙක්ද යත් මෙම සේවාව හඳුන්වා දුන් 2017 වසරේ සිට ශ්‍රී ලාංකික තරුණ ප්‍රජාව එයාර්පේ මගින් Google Play Store හරහා කරන ලද ගනුදෙනු වාර්තාගත ලෙස 10 ගුණයකින් වැඩි වී තිබීම මීට කදිම සාක්ෂියක් වේ.

### එයාර්ටෙල් එයාර්පේ සහ ඍජු බිල්පත් ගෙවීම් (DCB) ක්‍රමවේදය යනු කුමක්ද?

වර්ෂ 2017 දී දියත් කරන ලද එයාර්පේ යනු ශ්‍රී ලංකා වෙළඳපොළට පැමිණි පළමු ඍජු බිල් ගෙවීමේ ("DCB") සේවාව වේ. DCB යනු අන්තර්ජාල ගෙවීම් ක්‍රමවේදයක් වන අතර මින් පරිශීලකයින්ට තම දුරකථන බිලට එකතු වන ලෙස හෝ පෙර ගෙවුම් ශේෂයන් භාවිත කරමින් Google Play Store හරහා තම මිළදී ගැනීම් සිදු කිරීමේ හැකියාව ලැබේ.

එසේම අතපසුවී සිදුවන මිලදී ගැනීම් වැළක්වීම සඳහා මුදල් ආපසු ලබාගැනීමේ ක්‍රමවේදයක් එයාර්ටෙල් එයාර්පේ සතුව ඇත.එහිදී යම් භාණ්ඩයක් හෝ සේවාවක් මිළදී ගත් වහාම ඇප් එක තුළ මුදල් ආපසු ගැනීමේ නැතිනම් ගනුදෙනුව ආපසු හැරවීමේ සලකුණ දිස්වන අතර එය පැය දෙකක් පුරාවට පවතී.එසේම පරිශීලකයින්ට ඔවුන්ගේ ගූගල් ප්ලේ ගිණුමේ ඇති ඇණවුම් ඉතිහාසය හරහා එයාර්පේ මිලදී ගැනීම් පිළිබඳ සම්පූර්ණ විස්තරයක් ද තබා ගැනීමේ හැකියාව පවතී.

### එයාර්පේ කෙතරම් සුරක්ෂිත ද ?

එයාර්ටෙල් එයාර්පේ ගනුදෙනු සිදු කිරීමේදී ආරක්ෂිත ස්ථර කිහිපයක් ඇති නිසා ඔබගේ මුදල් වංචා කිරීම් සම්බන්ධයෙන් ඔබ බියක් ඇති කරගත යුතු නොවේ.ඕනෑම මිලදී ගැනීමකට පෙර පරිශීලිකයා විසින් තම ගූගල් ගිණුමේ මුරපදය( password) ඇතුළත් කර අනන්‍යතාව තහවුරු කරගත යුතු වෙයි.එයාර්ටෙල් එයාර්පේ ඍජුවම ඔබගේ දුරකථන ගිණුම හා සම්බන්ධව පවතින අතර DCB සේවාව ඔබගේ කාඩ්පත්

විස්තර හෝ වෙනත් පුද්ගලික තොරතුරු කිසිවක් එය ඔබගෙන් ඉල්ලන්නේ නැත.සරලව පවසන්නේ නම් ඔබගේ මිළදී ගැනීම් ක්‍රියාවලිය තුළ ඔබගේ කිසිදු දත්තයක් ලබා ගැනීමක් හෝ තුන්වන පාර්ශවයක් සමග හුවමාරු කිරීමක් සිදු නොකරනු ලැබේ.මින් අදහස් කරනුයේ ඊ වොලට් හෝ කාඩ් පත් භාවිතයේදී මෙන් අනාගතයේදී ඉවත් කළ යුතු ස්ථිතික දත්ත කිසිවක් මෙහි ඉතිරි නොවන බවයි.

## DCB මෙතරම් ජනප්‍රිය ඇයි ?

Google Play Store හි සාප්පු සාවරී යාමට ඔබට ක්‍රෙඩිට් කාඩ්පත් ,ඩෙබිට් කාඩ්පත් හෝ අඩු තරමේ බැංකු ගිණුමක්වත් අවශ්‍ය වන්නේ නැහැ.මෙය ඔන්ලයින් මිලදේ ගැනීම් සිදු කරන සමස්ත ශ්‍රී ලාංකිකයන්ට මෙන්ම තරුණ ප්‍රජාවටම හොඳ ප්‍රවෘත්තියක් වන අතර තමාගේ පුද්ගලික දත්ත සොරාගනීම්,අතපසුවීමෙන් කරනු ලබන මිලදී ගැනීම්,අමතර බැංකු ගාස්තු,යනාදී කරුණු සම්බන්ධයෙන් ද බිය වීමට අවශ්‍ය නොවේ.

අද වන විට ශ්‍රී ලාංකික තරුණ ප්‍රජාව ඔන්ලයින් හරහා එසේත් නැතිනම් අන්තර්ජාලය හරහා භාණ්ඩ මිළදී ගැනීම සඳහා වැඩි පෙළඹීමක් දක්නට ලැබේ.එහිදී ණය කාඩ්පත් හෝ වෙනත් ගෙවීම් ක්‍රම සඳහා පහසුකමක් නොමැති තරුණ ප්‍රජාවට මෙමගින් තම අවශ්‍යතා ඉතා පහසුවෙන් ඉටු කරගැනීමේ හැකියාව පවතී.එසේම සමහර මූල්‍යමය කටයුතු සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් සපුරා නොමැති පාසල් වයසේ හෝ රැකියා අපේක්ෂිත පුද්ගලයන්ට එයාර්ටෙල් එයාර්පේ හරහා තම අවශ්‍යතා ඉටුකරගනීම් හැකියාව පවතී.

**එයාර්පේ භාවිත කරනුයේ කෙසේද ?**

පාරිභෝගිකයනට ඉතා පහසුවෙන් එයාර්පේ හරහා සම්බන්ධ විය හැකි අතර ඔබ සතුව එයාර්ටෙල් සිම් පතක් ඇත්නම් කල යුත්තේ ගූගල් ප්ලේ ගිණුම් මෙනුවට ගොස් එහි ඇති 'Use Airtel Billing' තෝරාගැනීම පමණි .පසුව ඔබට අවශ්‍ය භාණ්ඩ හෝ සේවා තෝරාගැනීමෙන් පසු 'Buy' සලකුණ ක්ලික් කළ යුතුවේ. ඉන්පසු 'Bill my Airtel account' මත ක්ලික් කර පසුව ගූගල් ගිණුමේ පාස්වර්ඩ් එක ඇතුළත් කර මිළදී ගැනීම තහවුරු කිරීමෙන් පසු ක්‍රියාවලිය සම්පූර්ණ කර ගැනීමේ හැකියාව ලැබේ.

**අවසානයි.**

**භාරති එයාර්ටෙල් ලංකා පිලිබඳව**

වර්ෂ 2009 ජනවාරි 12 වන දින ශ්‍රී ලංකාවේ මෙහයුම් ඇරඹූ භාරති එයාර්ටෙල් (එයාර්ටෙල් ලංකා ) පාරිභෝගිකයන් මිලියනයක් කරා ලඟා වී සිටින ශ්‍රී ලංකාවේ වේගවත්ම සන්නිවේදන ජාලය වේ. තම වාණිජ මෙහයුම් ඇරඹූ 2009 වර්ෂයේ සිට වසර 03 ක් වැනි කෙටි කාලයක් තුළ එයාර්ටෙල් ලංකාවේ සෑම ප්‍රදේශයක් කරාම ව්‍යාපත් වූ අතර අද වන විට මුළු දිවයිනම ආවරණය කරනු ලබයි.ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ලියාපදිංචි කර ඇති එයාර්ටෙල් ලංකා දුරකථන අන්තර්ජාල

සේවාවන් සහ ආයතනික විසඳුම් ඇතුළු ඩිජිටල් ජංගම දුරකථන සේවාවන් රාශියක් පිරිනමයි.වැඩි විස්තර සඳහා " www.airtel.lk” වෙත පිවිසෙන්න.